# සාරාර්ථ ගවේෂී

## ඉතිහාස සාර සංග්‍රහය



අජිත් තල්වත්ත

Rs: 750.00/-
LN
124671

# සාරාර්ථ ගවේෂී

ඉතිහාස සාර සංග්‍රහය

Koha LIBRARY SYSTEM
RAJMNLIB
124671

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

## අජිත් තල්වත්ත

B.A. (spcial) M.A.(PDN) M.Phil (KLN)

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 124671 |
| වර් අංකය | 954.93 THA |

සීමාසහිත
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

පුස්තකාලය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

# පෙරවදන

සාමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර යන ක්ෂෙත්‍රවල විශේෂ දැනුම ලබාගෙන, විශ්වවිද්‍යාල ආචාර්යවරයකු වශයෙන් සේවයට බැඳෙන කවර හෝ පුද්ගලයකු වෙත පැවරෙනුයේ ගැඹුරු ශාස්ත්‍රීය සහ පර්යේෂණ වගකීමකි. අදාළ විෂය ක්ෂෙත්‍රය සිය ශාස්ත්‍රෝග්‍රහණය සඳහා තෝරාගනු ලබන විද්‍යාර්ථීන්ට දැනුම බෙදාදීම එබඳු ආචාර්යවරයකුගේ ප්‍රමුඛ වගකීම වේ. එහෙත් ඉන් ඔබ්බට ගොස් ශාස්ත්‍රීය අධ්‍යයන සහ පර්යේෂණ කටයුතුවල නිරතවීම තුළින් පවතින දැනුමට නව දැනුම එකතු කිරීම, පවතින දැනුමේ නිරවද්‍යතාව තහවුරු කිරීම හෝ නව අර්ථකථන සැපයීම එබඳු ආචාර්යවරයකු සතු මුඛ්‍ය වගකීමකි. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සාමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අජිත් තල්වත්ත මහතා එම වගකීම මැනවින් හඳුනාගෙන ඇති බව, මෙම ග්‍රන්ථය තුළින් මැනවින් ප්‍රකාශ වේ.

ඉතිහාස විෂයට අදාළ ශාස්ත්‍රීය ලිපි විසිහතරකින් සමන්විත මෙම ග්‍රන්ථය, විශේෂයෙන් ම ඉතිහාසය විෂය හදාරමින් පර්යේෂණ කාර්යට ප්‍රවිශ්ටවීමට අපේක්ෂා කරන නවක විද්‍යාර්ථීන් සඳහා මග පෙන්වීමක් සපයන බව මුලින් ම සඳහන් කළ යුතුය. තල්වත්ත මහතා ස්වකීය ශාස්ත්‍රීය අවධානය යොමු කොට ඇත්තේ මහනුවර යුගයේ ආගමික ඉතිහාසය කෙරෙහි බව "කන්ද උඩරට බෞද්ධාගමික පුනර්ජීවනයේ පිරිහීමට හේතු වූ සමාජ ඓතිහාසික පසුබිම, කන්ද උඩරට කිතුනු ආගමේ ව්‍යාප්තිය සහ ගණින්නාන්සේලාගේ ශාසනික කාර්ය භාරය" ආදී ලිපිවලින් පෙනේ. ඒ හා සමාන අවධානයක් මෙරට බ්‍රිතාන්‍ය අවධිය පිළිබඳ ව යොමුකර ඇති බව "රාජ්‍ය සහ ආගම : 1796 සිට 1847 දක්වා වූ කාලය තුළ බුද්ධාගම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ප්‍රතිපත්තිය, බ්‍රිතාන්‍ය යුගයේ වර්ධනය වූ කැරලි පිළිබඳ විග්‍රහයක්, යටත්විජිත යුගයේ ඇති වූ බෞද්ධ පුනරුදය පිළිබඳ

විමසා බැලීමක්, දහනමවැනි සියවසේ බෞද්ධාගමික පුනර්ජීවන ව්‍යාපාරය ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ආගම අනුකරණය කිරීමක් ද, අමද්‍යප ව්‍යාපාරය හා බැඳුණු සමාජ ආකල්ප සහ බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ කන්ද උඩරට පාලන සැකැස්ම" වැනි ලිපි මගින් පැහැදිලි වේ. ඒ අතර "ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය ඊ මුරකරුවාගේ ස්වභාවයක් ඉසුළුවේද" වැනි ලිපි තත්කාලයේ මෙරට දේශපාලන පසුබිම නව දෘෂ්ටිකෝණයකින් බැලීමට ඔහු ගත් උත්සහය පෙන්නුම් කරයි. මෙම ග්‍රන්ථයේ අඩංගු ලිපි අතර "නාථ දේව වන්දනය බැතිමතුන්ගේ ආකල්ප, කතරගම දෙවියන් සහ ආලත්ති අම්මාරු සහ බෝධිසත්ත්ව වන්දනය සහ රුහුණේ අවලෝකිතේශ්වර ප්‍රතිමා" වැනි ලිපි විශේෂ වැදගත්කමකින් යුතු වන්නේ මෙරට ජනවිඥානයට ප්‍රබල බලපෑමක් ඇති කරන දේව වන්දනය පෙරටු කොටගත් වෙනත් ඇදහිලි සහ විශ්වාස පිළිබඳ ව ඓතිහාසික දෘෂ්ටියකින් කෙරෙන විග්‍රහයක් එම ලිපිවල අන්තර්ගතව ඇති බැවිනි. මේ ආකාරයට මෙම ග්‍රන්ථයේ අඩංගු ලිපි මගින් තල්වත්ත මහතා සතු ශාස්ත්‍රීය කුතුහලය එක් විෂය ප්‍රදේශයකට සීමා නොවන බව මැනවින් විශද කරයි.

ඉතා සරල භාෂා ශෛලියකින් රචනා කොට ඇති මෙම ලිපි, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ, පර්යේෂකයින්ගේ පමණක් නොව සාමාන්‍ය පාඨක ප්‍රජාවගේ ද දැනුම සොයායාමේ අවශ්‍යතාව මැනවින් හඳුනාගෙන රචනා කරන ලද ඒවා බව කිව හැකිය. ඒ අනුව බලන කළ තල්වත්ත මහතා, විශ්වවිද්‍යාල ආචාර්යවරයකු සතු ශාස්ත්‍රීය වගකීම හඳුනාගෙන සිටින බව පැහැදිලිය. පේරාදෙණිය සරසවියෙන් ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය සහ ශාස්ත්‍රපති උපාධියත් කැලණිය විශ්වවිද්‍යාලයෙන් දර්ශනපති උපාධිය ලබා සිටින තල්වත්ත මහතා, දර්ශන විශාරද උපාධියේ කටයුතු අවසන් කර සිටින්නේය. එකී සුදුසුකම් මෙන්ම, මෙතෙක් ඔහු විසින් කරන ලද පර්යේෂණ අධ්‍යයන සහ පළ කරන ලද ශාස්ත්‍රීය ලේඛන බලන විට, මෙබඳු පර්යේෂණ ලිපි මාලාවක් එළිදැක්වීමට ඔහු සතු ශස්ත්‍රීය සුදුසුකම හා අත්දැකීම් පිළිබඳ ව අවබෝධයක් ලැබේ. ස්වකීය වෘත්තීය ජීවිතය ඉගැන්වීම හා අධ්‍යයන කටයුතුවලට පමණක් සීමා නොකොට තමන් ලබාගත් දැනුම සහ අවබෝධය ඉතිහාස විෂයෙහි උන්නතිය පිණිස

යෙදවීමට ඔහු දරන ප්‍රයත්නයේ ම කොටසක් ලෙස මෙම ග්‍රන්ථය හැඳින්වීමට කැමත්තෙමි. ඉතිහාසය විෂය හදාරන හා එම විෂය ක්ෂෙත්‍රයෙන් පර්යේෂණ සහ අධ්‍යයනවල නිරත වන ශාස්ත්‍රෝන්නතිකාමීන්ගේ අවධානය සහ ඇගයීමට ඔහුගේ මේ උත්සාහය පාත්‍ර වනු ඇතැයි අප උදක්ම අපේක්ෂා කරනුයේ එබැවිනි.

ඩිල්මා තුෂාරි කොග්ගලගේ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඉතිහාසය අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය.

# පටුන


1 පැරණි ලක්දිව දඬුවම් පිළිබඳ ඓතිහාසික විග්‍රහයක් 15 - 23

2 බෝධිසත්ත්ව වන්දනය සහ රුහුණේ අවලෝකිතේශ්වර ප්‍රතිමා 24 - 42

3 පහළොස්වැනි සියවස දක්වා ශ්‍රී ලාංකයේ බුද්ධ ශාසනයේ ගමන් මග 43 - 56

4 ශ්‍රී ලංකාවේ අග නගරය තුළ වැඩ සිටි දළදා වහන්සේ 57 - 63

5 ගණින්නාන්සේලාගේ ශාසනික කාර්ය භාරය 64 - 81

6 පෘතුගීසි හා ලන්දේසි පාලන සමයේ පහතරට ප්‍රදේශවල බෞද්ධාගමික ප්‍රබෝධය 82 - 97

7 කන්ද උඩරට කිතුනු ආගමේ ව්‍යාප්තිය 98 - 107

8 කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ශාසනික දේපළ (ගංගාරාම විහාරය ඇසුරෙන්) 108 - 124

9 දහඅටවැනි සියවසේ මහනුවර සමයේ බිතුසිතුවම් කලාව 125 - 134

10 නායක්කාර් රජවරුන් සහ වැලිවිට සරණංකර සංඝරාජ හිමි 135 - 142

11 කන්ද උඩරට බෞද්ධාගමික පුනර්ජීවනයේ පිරිහීමට බලපෑ ඓතිහාසික පසුබිම 143 - 157

12 උඩරට රාජධානියේ යුද හමුදා සංවිධානය 158 - 163

13 ශ්‍රී වික්‍රම රාජසිංහගේ දේශපාලන අභියෝග 164 - 175

14 කන්ද උඩරට රාජධානියේ පරිහානිය සහ බිඳ වැටීම 176 - 181

15 රාජ්‍ය සහ ආගම : 1796 සිට 1847 දක්වා වූ කාලය තුළ බුද්ධාගම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ප්‍රතිපත්තිය 182 - 202

16 බ්‍රිතාන්‍ය යුගයේ වර්ධනය වූ කැරලි පිළිබඳ විග්‍රහයක් 203 - 222

17 යටත්විජිත යුගයේ ඇති වූ බෞද්ධ පුනරුදය පිළිබඳ විමසා බැලීමක් 223 - 240

18 19 වන සියවසේ බෞද්ධාගමික පුනර්ජීවන ව්‍යාපාරය ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ආගම අනුකරණය කිරීමක් ද 241 - 251

19 අමද්‍යප ව්‍යාපාරය හා සමාජ, දේශපාලන ආකල්ප 252 - 260

20 බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ කන්ද උඩරට පාලන සැකැස්ම 261 - 270

21 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය රැ මුරකරුවාගේ ස්වභාවයක් ඉසුලුවේද? 271 - 282

22 නාථ දේව වන්දනය හා බැතිමතුන්ගේ ආකල්ප 283 - 295

23 කතරගම දෙවියන් සහ ආලත්ති අම්මාවරු 296 - 299

24 කන්ද උඩරට ඇදහිලි සහ විශ්වාස 300 - 314

අශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 315 - 320